# ඉන්දියානු මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ මා හිතවත් සහෝදර සහෝදරියනි,

නමස්කාර්, ආයුබෝවන්, වණක්කම්

ඉන්දියාවේ 79 වන නිදහස් දිනය නිමිත්තෙන් ඔබ සැමට මාගේ උණුසුම් සුභාශිංසන පිරිනමමි. අද දින මනා ඔරොත්තු දීමේ හැකියාවක් සහ නැගී එන ඉන්දියාවක් නිදහස සමරන්නේ සිය ජනතාවගේ අභිලාෂයන් ආරක්ෂා කරනා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස පමණක් නොව මැනිය හැකි ලෙස සහ නවතාලිය නොහැකි ලෙස නැගී එන ජාතියක් ලෙස ය; මිලියන ගණනක ජනතාවක් දරිද්‍රතාවයෙන් මුදවා ගන්නා ජාතියක් පමණක් නොව සඳ වෙත යානා යවන ජාතියක් ලෙස ය.

ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 4ක් ඉක්මවන දළ දේශීය නිෂ්පාදිතයක් සහ 6.2%ක වාර්ෂික වර්ධන වේගයක් (IMF,2025) සමඟින් ඉන්දියාව දැන් ලොව සිව් වන විශාලතම ආර්ථිකය වේ. මෙම වර්ධනය සංඛ්‍යා ලේඛනවලට පමණක් සීමා වී නොමැති අතර එතුළින් රට පුරා ඉහළ යන ආදයම්, පුළුල් වන අවස්ථාවන් සහ ශක්තිමත් වන ආර්ථික පදනම් පිළිබිඹු වේ. ඉන්දියාව වර්ෂ 2028 වන විට ජර්මනිය අබිබවමින් ලොව තෙවන විශාලතම ආර්ථිකය බවට පත් වන බව පුරෝකථනය කර තිබේ.

මෙම වර්ධනය විශේෂයෙන් ම සුවිශේෂී වන්නේ එහි අන්තර්ග්‍රහණීයත්වය හේතුවෙනි. ලෝක බැංකු දත්තවලට අනුව, ඉන්දියාවේ දැඩි දරිද්‍රතාවය 2011-12 වර්ෂයේ වාර්තා වූ 27.1% සිට 2022-23 වර්ෂයේ 5.3% දක්වා තියුණු ලෙස පහත වැටී ඇත. මෙම කාල වකවානුවේ අසමානතාවය ද පහළ ගොස් ඇත. ඉන්දියාව දැන් ගිනි දර්ශකයේ 25.5ක අගයක් සමඟින් “මධ්‍යස්ථ වශයෙන් අවම” කාණ්ඩය යටතේ ස්ථානගත වෙමින් ගෝලීය වශයෙන් සිව් වෙනුවට ඉහළම සමානතාවයක් ඇති රට බවට පත් වී ඇත.

නිර්ගිත ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ ක්‍රමානුකූල පරිවර්තනය මෙම ප්‍රතිඵලයන්ට හේතු විය. භාණ්ඩ සහ සේවා බද්ද (GST) සහ ඒකාබද්ධ ගෙවීම් අතුරු මුහුණත (UPI) වැනි ප්‍රධාන මූලපිරීම් ඉන්දියාවේ ආර්ථිකය නවීකරණය කර ඇත. ආයුෂ්මාන් භාරත් සහ ජන් ධන් යෝජනා වැනි සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම මිලියන ගණනක ජනතාවක් සෞඛ්‍යමය සහ මූල්‍යමය වශයෙන් අන්තර්ග්‍රහණය කරගෙන ඇත්තේ වර්ධනය වඩාත්ම දුර්වල ජනතාවට පවා වර්ධනයේ ප්‍රතිලාභ හිමි වන බව සහතික කරමිනි.

ජනගහනයෙන් 65%ක් අවුරුදු 33ට අඩු වීම යන කාරණය ද ඉන්දියාව නිදහසින් වසර සියයක් සමරන වර්ෂ 2047 වන විට සංවර්ධිත රාජ්‍යයක් හෙවත් වික්සිත් භාරත් බවට පත් වීමේ අරමුණ ළඟා කර ගැනීමට මහෝපකාරී වේ.

ඉන්දියාවේ වර්ධනය තිරසාරභාවයෙන් ද යුතු වේ. ඉන්දියාව දැන් සිය ස්ථාපිත විදුලි ධාරිතාවයෙන් 50%ක් පොසිල ඉන්ධන නොවන මූලාශ්‍රයන්ගෙන් ජනනය කරයි. ඉන්දියාව මෙම සුවිශේෂී කඩඉම වෙත ළඟා වූයේ පැරිස් ගිවිසුම යටතේ සිය ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් යටතේ ඉලක්කගත වර්ෂයට වසර පහක් පෙරාතුව ය. ඉන්දියාවට පිරිසිදු බලශක්තිය වෙත මාරු වීම වර්ධනය සඳහා විකල්පයක් නොව එය සවිමත් කරන සමාන්තර මාර්ගය කි.

ඉන්දියාවේ 79 වන නිදහස් දිනය ඉන්දියාව හා සමගාමීව ම සිය නිදහස් ගමන් මඟ ඇරඹූ ශ්‍රී ලංකාවට අදාළත්වයක් උසුලන්නේ මෙම සන්දර්භය තුළ ය. අප රාජ්‍යයන් ද්විත්වයම අපගේ ජනතාවට වඩා හොඳ ජීවන තත්ත්වයන් ළඟා කර දීමේ අරමුණ සමඟින් ප්‍රජාතන්ත්‍රවාදයට අප්‍රතිහත කැපවීමක් සහිත මාර්ගයක එක්ව ගමන් කර ඇත. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අපගේ පොදු යටත් විජිත ඉතිහාසයෙන් ඔබ්බට විහිදෙන ගැඹුරු සහ ඓතිහාසික බැඳීම් පවතී. අප දෙරට සැබවින්ම “ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයන්” කරන්නේ මෙම බැඳීම් ය. ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා සවිමත් සහ විචිත්‍රවත් වන්නේ ගැඹුරින් මුල් බැසගත් මෙම ඥාතිත්වය තුළිනි. ඉන්දියාවේ සමීපතම සමුද්‍රීය අල්වැසියා වන බැවින් ශ්‍රී ලංකාවට ඉන්දියාවේ ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ යන ප්‍රතිපත්තිය සහ ‘සියලු කලාපයන් තුළ ආරක්ෂාව සහ වර්ධනය සඳහා අන්‍යෝන්‍ය සහ සාකල්‍ය වැඩි දියුණුව’ (MAHASAGAR) යන දැක්ම තුළ විශේෂ තැනක් හිමි වේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව එකිනෙකාට ලබා දෙන ප්‍රමුඛතාවය මෑතක දී ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් සිදු කළ ඉන්දීය සංචාරය තුළින් සහ ඉන්දීය අග්‍රාමාත්‍යතුමා විසින් සිදු කළ ශ්‍රී ලංකා සංචාරය තුළින් ද පිළිබිඹු විය. අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සිය ප්‍රථම විදෙස් සංචාරය සඳහා දිල්ලිය තෝරා ගත් අතර එතුමා ජනාධිපති ධූරයේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව ප්‍රථම විදෙස් රාජ්‍ය නායකයා ලෙස අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා පිළිගත්තේය. “සැබෑ මිත්‍රශීලී අසල්වැසියකු වශයෙන් සිය යුතුකම් ඉටු කර තිබීම ඉන්දියාවට ආඩම්බරයක්. 2019 වසරේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය, කොවිඩ් වසංගතය හෝ මෑත කාලීන ආර්ථික අර්බුදය යන කවර අවස්ථාවේ දී වුව ද අප සෑම අසීරු අවස්ථාවක ම ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ ශක්තිමත්ව රැඳී සිට තිබෙනවා” යනුවෙන් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා 2025 අප්‍රේල් මස සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර ප්‍රකාශ කළේය.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සබඳතා අන්‍යෝන්‍ය විශ්වාසය සහ සුහදත්වය මත පදනම් වී තිබේ. පසුගිය මාස හය පුරා අපි ශ්‍රී ලංකා රජය සමඟින් හඳුනා ගන්නා ලද අංශයන්හි ප්‍රදාන මත පදනම් සහයෝගයන් අඛණ්ඩව ඉදිරියට ගෙන යන අතරම ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය කරමින්, තාක්ෂණික සහය සහ පුහුණුව සඳහා සහයෝගීතාවය ඉහළ නංවමින්, දෙරට ජනතාව අතර සබඳතා වැඩි දියුණු කරමින් සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායී සම්බන්ධකතා ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කරමින් අපගේ ද්විපාර්ශවික සබඳතාහි විවිධ පැතිකඩ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කරමින් සිටින්නෙමු. ඉන්දියාව විවිධ ක්ෂේත්‍රයන් තුළ ණය මත පදනම් වූ ප්‍රවේශයක සිට ආයෝජන ප්‍රමුඛ හවුල්කාරිත්වයක් දක්වා තීරණාත්මක වෙනසක් සඳහා ප්‍රයත්න දරමින් සිටියි. මෙම ප්‍රවේශයේ මූලික අභිප්‍රාය වන්නේ ණය බරින් රට පීඩාවට පත් නොකරමින්, ශ්‍රී ලංකාවේ ජනතාවට ආර්ථික සංවර්ධනය සහතික කිරීම යි.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාලතම වෙළෙඳ සහකරු යි; ප්‍රධානතම විදෙස් ආයෝජන මූලාශ්‍රය යි; සංචාරකයන් වැඩිම ප්‍රමාණයක් පැමිණෙන රට යි. අපගේ සංවර්ධන හවුල්කාරිත්වය පුළුල් පදනමකින්

යුක්ත වන අතර එහි මූලික අවධානය හිමි වන්නේ ජනතාවට ය. මෙම වසරේ අප්‍රේල් මස ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විවෘත කළ සහ නිවේදනය කළ ව්‍යාපෘතීන් වන දඹුල්ලේ උෂ්ණත්ව පාලිත කෘෂිකර්ම ගබඩාව, දුම්රිය මාර්ග ව්‍යාපෘතීන්, සාම්පූර් විදුලි බලාගාරය, ආගමික ස්ථාන සඳහා වහල මත සවිකරන සූර්යබල පද්ධතීන්, අනුරාධපුරය පූජා නගර සංකීර්ණය, තිරුකෝනේෂ්වරම් කෝවිල සහ සීතා එළිය කෝවිල සඳහා සහයෝගය ලබා දීම වැනි ව්‍යාපෘතීන් තුළින් මෙම ප්‍රවේශය අවධාරණය කෙරේ.

ඉන්දියාව නිවාස, සුවසැරිය ගිලන්රථ සේවාව, යාපනයේ යාපනය තිරිවල්ලුවර් සංස්කෘතික මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය සහ ධාරිතා ගොඩනැගීමේ මූලපිරීම් හා සම්බන්ධ ව්‍යාපෘතීන් යනාදිය හරහා ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් තවදුරටත් ක්‍රියාත්මක කරයි. මෙම ව්‍යාපෘතීන් ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන් හා සමපාත වන අතර ජන ජීවිතය සෘජුවම අර්ථාන්විත ලෙස නංවාලීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් පමණක් නොව බෙදා හදා ගන්නා අභිලාෂයන්ගෙන් ද පොදු අනාගතයකින් ද ගැඹුරින් බැඳී ඇත. අපගේ දෛවයන් එකිනෙක හා බද්ධ වී ඇත. ඉන්දියාව නැගී සිටින විට අපගේ වර්ධනය විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ඇතුළු අපගේ අසල්වාසී රටවල් සමඟ විශ්වාසය, ගෞරවය සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත පදනම් වන හවුල්කාරිත්වයන් හරහා බෙදා ගැනෙන බව සහතික කිරීමට අපි කැප වී සිටිමු. ඉන්දියාව සිය අභිලාෂයන් අපගේ මෙම ප්‍රමුඛතාවයන් හා සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාව ඇතුළු ගෝලීය දකුණේ රටවල් සඳහා ශක්තිමත් හඬක් වෙනුවෙන් පෙනී සිටියි.

මෙම නිදහස් දිනයේදී, වඩා ශක්තිමත් ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වයක් සහ බෙදා හදා ගන්නා සාමය, ප්‍රගතිය සහ සෞභාග්‍යය උදෙසා අපගේ කැපවීම යළි අලුත් කර ගනිමු.

ජයි හින්ද්.

ස්තුතියි, නණ්රි, ධන්‍යවාද්.